# නිවාඩුවට අරුතක් - ක්රි යාකාරකම්පත්‍රය

## සිංහල භාෂාව හා සාහිත්යරය- 11 ශ්‍රේණිය

01) පහත දැක්වෙන මාතෘකා සඳහා වචන **350කට** නොඅඩු වන සේ රචනා ලියන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න.

I. වර්තමානයේ විශාල වශයෙන් මිනිස් ජීවිත බිලිගන්නා රෝග අතර "කොවිඩ් 19" හෙවත් නව කොරෝනා වෛරසය ආසාදනය වීම බරපතල ගැටලුවක් බවට පත් වී ඇත. ලෝකයේ බලවතුන් යයි කියාගන්නා බොහොමයක් රටවලට මේ වන විට මෙම වෛරසයට හිස නැමීමට සිදුව ඇත. මිනිස් ජීවිත දහස් ගණන් බිලි ගනිමින්, ලොව ජනගහනයෙන් විශාල ප්‍රමාණයක් නිවෙස්වලට කොටු කරමින්, සොබාදහමට නැවත තම අධිකාරය අයත්කර දෙමින් ආක්‍රමණය කරන මෙම වෛරසය හමුවේ තාක්ෂණිකව විශ්ව ගම්මානයක් බවට පත් වූ ලෝකයට දිගුකාලීනව දරුණු ආර්ථික අර්බුදයකට මුහුණ දීමට සිදු වී ඇත. මේ මොහොතේ මුළු ලෝකයට ම එකාවන්ව අත් වැල් බැඳ නැගිටීමට කාලය එළඹ ඇත.

II. නිදහසේ සතුට විඳිමින් පාසල් ගිය දරුවන්ගේ ළමා කාලය අද බෙහෙවින් වෙනස් වී ඇත. ඔවුහු පෙර පාසල් අවධියේ සිට අවසානය දක්වා ම දැනුම ලැබීමේ සටනක නියැලී සිටිති. ආර්ථික, සාමාජික තරගයකට යොමුව සිටින දෙමාපියෝ ද තම දරුවන් තරගයට යොමු කරමින් සිටිති. මෙයින් පීඩා විඳින්නෝ දරුවෝ ය.මේ තත්ත්වය වටහාගෙන දරුවන්ගේ ලෝකය දරුවන්ට දීමට කටයුතු කිරීම ළමා ලෝකය අත්විඳි වැඩිහිටි පරපුරේ යුතුකමකි.

02) පහත දැක්වෙන ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ගීතය සාහිත්‍යයේ සහ සංගීතයේ මධුර සුසංයෝගයකි. ආරම්භයේ දී ගීතය, සංගීතයේ සහ ගායනයේ එකතුවක් ලෙස සැලකෙමින් එහි සාහිත්‍ය නොවැදගත් ලෙස අමතක කරනු ලැබුව ද අද ගීතය, සාහිත්‍ය ප්‍රධාන කොටගත් අර්ථ මූලික කලාවක් බවට පත්ව තිබේ. ප්‍රචලිත හා ප්‍රබල බහුරසාස්විත කලාංගයක් ලෙස ගීතය තවදුරටත් බැහැර කරලිය නොහේ. ඇතැම් විචාරකයින් විසින් අවජාතක සාහිත්‍යයකැයි ගර්හිත කලාවක් සේ ගීතය හැඳින්වුණු නමුත් ඉකුත් යුගයේ ගීතය විසින් අත්පත් කොට ගෙන ඇති වර්ධනීය ජයග්‍රහණ හමුවේ එකී විරෝධතා නිෂ්ප්‍රභ වී යයි.

ශුද්ධ සංගීතය ද විවිධ ගායන ශෛලීන් අනුගත අර්ථ මූලික නොවන ගායනාවන් ද රසය සහ චමත්කාරය උපදවන බව සැබෑ ය. එහෙත් නිශ්චිත අර්ථ මූලික රස නිෂ්පත්තියකි.සාහිත්‍යය යන්නෙහි නෛරුක්තික අර්ථය පරිදි රස සහ අරුත් සහිත වූයේ සාහිත්‍යයයි. ගීත සාහිත්‍යය ද එකී රස සහ අර්ථ සහිත භාවයෙන් නොමිදුණේ ය.

I. මේ ඡේදවලින් කියැවෙන්නේ කවර සාහිත්‍යාංගයක් ගැන ද?

II. ඉකුත් යුගයේ ගීතය කෙරෙහි තිබූ විරෝධතා පහවීමට හේතුව කුමක් ද?

III."සාහිත්‍යය" යන්නෙහි අර්ථය සඳහන් කරන්න.

IV. ඇතැම් විචාරකයන් ගීතය පහත් කොට සැලකීම සඳහා භාවිත කළ යෙදුම් දෙක දක්වන්න.

V. පහත සඳහන් වචනවල අර්ථය ලියන්න.

I. වර්ධනීය II. නිෂ්පත්තිය

03) මේ වන විට කොරෝනා වෛරසය ශීඝ්‍රයෙන් ලංකාව පුරා ව්‍යාප්ත වෙමින් පවතී. කොරෝනා වෛරසය ව්‍යාප්ත වීමට බලපාන හේතු රැසකි.එසේ ම පෙන්නුම් කරන රෝග ලක්ෂණ ද බොහෝ ය. ඉතා ඉක්මනින් ජනතාව දැනුවත් කර සමාජ දූරස්ථකරණය ඇතුළු වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කළ යුතුව ඇත.ඔබ සමගිපුර මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා යයි සිතා ප්‍රදේශවාසීන් මේ පිළිබඳ දැනුවත් කිරීමට වචන 100ක පමණ අත් පත්‍රිකාවක් සකස් කරන්න.

04) පහත දැක්වෙන ඡේදය කියවා එහි සාරාංශය වචන **45-50** ප්‍රමාණයකින් ලියන්න.

අත්දැකීම් හා බැඳුණු වින්දනාත්මක හැඟීම් වෙළාගත් සිතිවිලි, බස් වහර හා රිද්මය සමග කැටි කළ නිර්මාණය කාව්‍යයයි. ජීවිතයේත් පරිසරයේත් මුහුණ දෙන විවිධ සංසිද්ධිවල දී පුද්ගල මනස සංවේදී වෙයි. බසේ ජීවය නොහඳුනනනෝ බස හැසිරවීමේ ශක්තියෙන් හීන බැවින් සිය වින්දනය හදවතේ සීමා ඉක්මවා යවන්නට අපොහොසත් වෙති. බසේ ජීවය හඳුනනනෝ බසත්, රිද්මයත්, මනා ලෙස ගළපමින් තම ප්‍රතිභා ශක්තියෙන් තමා ලද වින්දනාත්මක හැඟීම රසවත් නිර්මාණයක් බවට පත් කරති. එමගින් සහෘදයා ද ආනන්දයට පත් කරති. ගද්‍ය පද්‍ය හා චම්පු යන සියලු සාහිත්‍යාංග කාව්‍ය ලෙස සංස්කෘත ආලංකාරිකයෝ හැඳින්වූහ. සිංහල ලේඛකයන් හා කවියන් සංස්කෘත සාහිත්‍යයෙන් ද විචාර සිද්ධාන්තයන්ගෙන් ද ආභාසය ලද නමුත් ඔවුන් කාව්‍යය යන්න පද්‍යයට ම ආරෝපණය කළ බව පෙනේ. සිංහල කවියා ද රසිකයා ද කාව්‍යය යයි කියන්නේ පද්‍යයට ය. ඒ නිසා ම කාව්‍ය නිර්මාණය උදෙසා මෙරට ලියැවුණු උපදේශ ග්‍රන්ථ මෙන් ම විචාර සිද්ධාන්ත ද පද්‍ය කෙරෙහි ම යොමු විය. මේවා අනුගමනය කරමින් කවීහු බසේ ව්‍යක්තිය හඳුනාගෙන මනා පද ගැළපීමෙන් හා විවිධ විරිතෙන් කාව්‍ය රචනා කළහ.

05) I. ඔබ ශ්‍රවණය කළ දේශාභිමානී ගීත පහක මුල් පද පේළි ලියා දක්වන්න.

II. ඔබ ශ්‍රවණය කළ මව් ගුණ ගීතයක් හා පිය ගුණ ගීතයක් සම්පූර්ණයෙන් ලියා දක්වන්න.

III. ඉහත සඳහන් ගීතයක් පිළිබඳව ඔබ තුළ ඇති වූ හැඟීම් ඇසුරෙන් කෙටි රසාස්වාදයක් ලියන්න.

06) I. සිංහල සාහිත්‍ය සංග්‍රහයේ එන පහත සඳහන් පාඩම් අතරින් තෝරාගත් පාඩම් තුනකින් කෙටි ප්‍රශ්න **20 බැගින්** සකස් කරන්න.

I. අඟුල්මල් දමනය

II. උග්ගසේන නම් සිටුපුත්හුගේ වස්තුව

III.කැරගලය වැජඹෙයි මේ ලෙසින් සිට

IV. මග විසිතුරු

V. කුරහන් ඉසිමුව කළුවර බලාලා

VI. අපට වැසිකිළියක්

VII. දියමන්ති මාලය

VIII.දෑතේ කරගැට සිඹ සනසන්නට

IX. වස්සානය

II. ඔබ ඉහත ප්‍රශ්න සකස් **නොකළ** පාඩම් ඇසුරෙන් පහත සඳහන් ලක්ෂණ යොදා වගුවක් සකස් කරන්න.

I. පාඩමේ නම

II. උපුටාගත් ග්‍රන්ථය

III. කතුවරයා

IV. කතුවරයාගේ වෙනත් කෘති

III. ඉහත සියලු පාඩම්වලට අදාළ දුරවබෝධ වචන ලැයිස්තුවක් සකස් කරන්න.

07) I. 11 ශ්‍රේණියේ පෙළ පොතේ සඳහන් ලේඛකයන් හා ගීත රචකයන් නම් කරන්න.

II. එම ලේඛකයන්ගේ හා ගීත රචකයන්ගේ නිර්මාණ දෙක බැගින් ලියා දක්වන්න.

08) මෙම නිවාඩු කාලයේදී ඔබ කියවූ නවකතාවක්, කෙටි කතාවක් හෝ පරිවර්තන ග්‍රaන්ථයක් පිළිබඳව කෙටි විචාරයක් ලියන්න.